සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

01 | S | I | II

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2567 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)

පැය තුනයි

## (01) සිංහල - I පත්‍රය

අමතර කියවීම් කාලය -මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

සැලකිය යුතුයි :

- ※ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු **40** ක් ලැබේ.
- ※ අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ※ ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.
- ※ එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

---

- අංක **1** සිට **40** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

*(ලකුණු 01 × 40 = 40 යි)*

- අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප පිළිතුර තෝරන්න.

1. අර කෙල්ලට යන කල මොකක් ද කියල කතා කරගන්න ආව මිසක් මෙහෙ **පැලපදියම් වෙන්න** ආව ගමනක් නෙවෙයි.
   (1) දබර වෙන්න (2) සතුටු වෙන්න
   (3) පදිංචි වෙන්න (4) උදව් වෙන්න

2. ඒකට **ඉතින් දෙකට දෙගිඩියාවක්** තියාගන්න ඕනැ නෑ වැඩේ කෙරෙනව නම් මම කතා කරන්නම්.
   (1) පෙර සූදානමක් (2) අවිනිශ්චිතතාවක්
   (3) හිතා බැලීමක් (4) පසුබෑමක්

3. අහල පහල මිනිස්සුන්ගෙ **උල්පන්දම් දීම** නිසා තමයි නැන්දම්මගෙයි ලේලිගෙයි විරසකේ වැඩිවෙලා තියෙන්නෙ.
   (1) වැරදි පෙන්වා දීම (2) අත්උදව් දීම
   (3) උගුල් ඇටවීම (4) වරදට අනුබල දීම

4. ව්‍යඤ්ජනාක්ෂරයකට ස්වරයක් සහිත හෝ රහිත තවත් ව්‍යඤ්ජනාක්ෂරයක් සංකේතයකින් සම්බන්ධ බව දැක්වෙන ව්‍යඤ්ජන සංයුක්ත සංකේත ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) ශාක්‍ය, ශ්‍රාවස්ති, ධ්‍රැවය, කෘත්‍ය (2) ගෞතම, මහෞෂධ, ඓතිහාසික, ශෛලිය
   (3) ශාස්ත්‍ර, වෛවර්ණ, තුංමංහන්දිය, භාග්‍ය (4) කෞතුක, වෛදික, කෘතහස්ත, ත්‍රාසය

5. දීර්ඝ ස්වරවලින් පටන් ගන්නා පද පමණක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) පෞරුෂ්‍ය, නෛතික, ධීමත්, කාවින්ද (2) කෘෂ්ණ, ශුක්ල, විධුර, නූතන
   (3) ශ්‍රේණිය, ධුරය, ශ්‍රීමත්, මෙහෙණවර (4) කේවල, තාරුණ්‍ය, දෙරණ, ප්‍රාර්ථනය

[ 2 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

6. සමාන ශබ්ද සහිත අල්පප්‍රාණ හා මහාප්‍රාණ අක්ෂර දෙකකින් යුත් වචන පමණක් ඇතුළත් පද පෙළිය තෝරන්න.
   (1) ශ්‍රද්ධාව, සම්භූත, වෘද්ධ, තථාගත (2) සජ්ඣායනය, කාමච්ඡන්ද, අට්ඨකතා, ජේතවත්ථු
   (3) නිෂ්ඵල, අධිෂ්ඨාන, සතිපට්ඨාන, ප්‍රතිබද්ධ (4) ප්‍රච්ඡන්න, මජ්ඣිම, වච්ඡගොත්ත, ප්‍රවිෂ්ට

7. අකාරාදි පිළිවෙළ නිවැරදිව දැක්වෙන පද පෙළිය තෝරන්න.
   (1) පහළගම, ඉහළගම, මැදගම, යටගම
   (2) උඩුනුවර, යටිනුවර, මහනුවර, මැදමහනුවර
   (3) කළුඅග්ගල, කළුකොඳයාව, කළුතර, කළුබෝවිල
   (4) රත්නපුරය, සිරිපුර, දියසෙන්පුර, මැල්සිරිපුර

8. සෑම පදයක ම අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පෙළිය කුමක් ද?
   (1) අගමැතිනිය, කිසකිළිය, ශීඝ්‍රගාමී, විශිෂ්ට
   (2) විලාශය, වැඩමුළුව, කඩුළුරැකීම, වලාකුළු
   (3) භෂ්මාවශේෂ, භික්ෂාධනය, අභිලාෂය, ද්‍රාවනය
   (4) රූපලාවණ්‍ය, දූමරථය, චිරස්ථිතිය, කෘතිම

9. පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියාපදවල ධාතු ප්‍රකෘති නිවැරදි ව දැක්වෙන පද පෙළිය තෝරන්න.
   බුර බුරා නැගෙන ළැව්ගින්න චණ්ඩ මාරුතයෙන් වියරු වී රුක්ස ගස්වැල් දවා හළු කරමින් හාත්පස පැතිරෙයි.
   (1) නැගෙන, වෙන, දවා, පැතිර (2) නගි, ව, දව, පතුර
   (3) නංව, ව, දැවි, පතුරා (4) නැගෙන, වෙ, දවා, පතුර

10. ඒකවචන උක්ත පදයක් හා බහුවචන අනුක්ත පදයක් ඇතුළත් පද පෙළිය තෝරන්න.
   (1) සම්ප්‍රදායයෝ, බිළිඳෙක්, රීතීහු, නිරිඳෙකු
   (2) දාර්ශනිකයකු, නිරීක්ෂකයෙක්, ජානපදිකයකු, නිර්ණායකයක්
   (3) සංක්‍රමණිකයෝ, ත්‍රස්තවාදීන්, සරණාගතයකු, සෙබළු
   (4) ශිල්පීන්, ශ්‍රමිකයෝ, ඇදුරෙක්, මොනරු

11. මුලින් දැක්වෙන සන්ධි වර්ගවලට අනුරූප නොවන සන්ධි පදයක් ඇතුළත් වරණය කුමක් ද?
   (1) ආගම සන්ධිය : සිවුරඟ, නිරවුල්, දෙවුර, නිරහංකාර
   (2) පූර්වරූප සන්ධිය : වත්තම්, සිත්තම්, සන්නස්, කම්මල
   (3) පූර්වස්වරලෝප සන්ධිය : තරිඳු, රියැදුරු, නළඟන, ගුණැති
   (4) ගාත්‍රාදේශ සන්ධිය : පිළියම්, සුරුවම්, දහවල්, බිළියම්

12. පහත සඳහන් පාඨයේ තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති රූප අනුපිළිවෙළින් දක්වා ඇති පද පෙළිය කුමක් ද?
   එක ම අමුද්‍රව්‍යවලින් නිර්මිත පාලමේත් ප්‍රාකාරයේත් අපේක්ෂිත අරමුණු දෙකකි. පාලම ජනතාව එක්කරයි. ප්‍රාකාරය ජනතාව වෙන් කරයි.
   (1) සම්බන්ධ විභක්තිය, කරණ විභක්තිය, ප්‍රථමා විභක්තිය, කර්ම විභක්තිය
   (2) කරණ විභක්තිය, සම්බන්ධ විභක්තිය, ප්‍රථමා විභක්තිය, කර්ම විභක්තිය
   (3) ප්‍රථමා විභක්තිය, සම්බන්ධ විභක්තිය, කරණ විභක්තිය, කර්ම විභක්තිය
   (4) කර්ම විභක්තිය, ප්‍රථමා විභක්තිය, කරණ විභක්තිය, සම්බන්ධ විභක්තිය

13. මුලින් දී ඇති සමාස වර්ගයට ඇතුළත් පද පමණක් දැක්වෙන වරණය කුමක් ද?
   (1) අන්‍යාර්ථ සමාසය : සියපත්, මින්දද, තිනෙත්, දසබල
   (2) විභක්ති සමාසය : ගත්කරු, අත්කම්, තිලුපුල්, ඉනිවැට
   (3) විශේෂණ සමාසය : නාහිමි, සිප්සතර, සුසිරිත්, මීදුම්
   (4) අව්‍යය සමාසය : නොසරුප්, සුබස, නරසී, අනාචාර

[ 3 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

2745

14. තද්ධිත නාම **එකක්** පමණක් ඇතුළත් වාක්‍යය තෝරන්න.
   (1) නැණැති දනෝ අනාගත අවශ්‍යතා ගැන සිතා උපයන ධනයෙන් කොටසක් ඉතිරි කරති.
   (2) ඇතැම්විට තාවකාලික ව හමුවන මිනිස්සු අපට සදාකාලික පාඩමක් උගන්වති.
   (3) ජානපදිකයන් සඳහා මෙවර දියවර නිකුත් කිරීම වාරි තාක්ෂණික නිලධාරීන්ගේ නිර්දේශය මත සිදු වේ.
   (4) ඔබට යමක් සරල ව පැහැදිලි කළ නොහැකි නම් ඔබ එය පැහැදිලි ව අවබෝධ කරගෙන නැත.

15. විනා, හැර, මිස, මුත් යනු විනාර්ථයෙහි නිපාත පදයි. ඒ අනුව පහත සඳහන් වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද අයත් වන නිපාත පද වර්ග පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?

   වැරදි ආකල්පය හුළං බැස ගිය ටයරයක් **වැනි** ය. වෙනස් කරන **තුරු** ඉදිරියට **යා** නොහැකි **ය**.
   (1) උපමාවාචක නිපාත, සමාප්තිවාචක නිපාත, සීමාර්ථයෙහි නිපාත, නිෂේධාර්ථයෙහි නිපාත
   (2) උපමාවාචක නිපාත, සීමාර්ථයෙහි නිපාත, නිෂේධාර්ථයෙහි නිපාත, සමාප්තිවාචක නිපාත
   (3) නිෂේධාර්ථයෙහි නිපාත, උපමාවාචක නිපාත, සීමාර්ථයෙහි නිපාත, සමාප්තිවාචක නිපාත
   (4) උපමාවාචක නිපාත, නිෂේධාර්ථයෙහි නිපාත, සීමාර්ථයෙහි නිපාත, සමාප්තිවාචක නිපාත

16. මුලින් දී ඇති කෘදන්ත පදවලට **නොගැළපෙන** උදාහරණයක් සහිත පද පේළිය තෝරන්න.
   (1) කර්මකාරක කෘදන්ත : ගැයුණු, ගෙතුණු, ගොඩනැගෙන, කෙරෙන
   (2) කර්තෘකාරක කෘදන්ත : පැවසූ, කණින, දරන, වැයෙන,
   (3) භාව කාරක කෘදන්ත : හැදෑරීම්, සිතිවිලි, කියමන්, නැටුම්
   (4) කරණ කාරක කෘදන්ත : පියන, දවනය, තරණය, මානය

17. යෙදවුම් මිල පහත **හෙළුවහොත්** ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවත්නා ඉහළ පිරිවැය අවම කළ හැකි බව ඒ පිළිබඳ සොයා බැලීමට පත්කළ කමිටුව සිය වාර්තාව ඉදිරිපත් **කරමින්** ප්‍රකාශ කළ අතර ව්‍යාපාර පිරිවැටුම් බදු අඩු කිරීම කෙරෙහි ද අවධානය **යොමු කොට ක්‍රියා කරන්නැයි** ඇමතිවරයාගෙන් ඉල්ලා සිටිය හ.
   ඉහත වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත ක්‍රියාපද කවර ක්‍රියාවර්ගයට අයත්දැයි පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.
   (1) විධාන ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා
   (2) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධාන ක්‍රියා
   (3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, විධාන ක්‍රියා
   (4) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා, විධාන ක්‍රියා

18. පහත දැක්වෙන වාක්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද හැඳින්වීම සඳහා යෙදී ඇති ව්‍යාකරණාංග අනුපිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?
   **වාරි තාක්ෂණ ශිල්පීන්** ලවා වැව් බඳවා කෘෂිකර්මාන්තය නගා සිටුවීමට කළ **මෙහෙය** වෙනුවෙන් හෙළ **ගොවීන් විසින්** පෙර **රජවරු** දේවත්වයෙන් පුදනු ලැබූහ.
   (1) ප්‍රයෝජක කර්තෘ, අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ, උක්ත කර්තෘ
   (2) අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ, උක්ත කර්තෘ
   (3) උක්ත කර්තෘ, අනුක්ත කර්මය, අනුක්ත කර්තෘ, ප්‍රයෝජක කර්තෘ
   (4) ප්‍රයෝජක කර්තෘ, අනුක්ත කර්මය, උක්ත කර්තෘ, අනුක්ත කර්තෘ

19. 119 පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව පොලිස් නිලධාරීහු සැකකරුවන් අත්අඩංගුවට ගත්හ.
   ඉහත වාක්‍යය කර්මකාරකයට හැර වූ විට නිවැරදි වාක්‍යය වන්නේ මින් කුමක් ද?
   (1) 119 පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව පොලිස් නිලධාරීන් විසින් සැකකරුවෝ අත්අඩංගුවට ගනු ලබති.
   (2) 119 පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව පොලිස් නිලධාරීන් විසින් සැකකරුවන් අත්අඩංගුවට ගැනුණහ.
   (3) 119 පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව පොලිස් නිලධාරීන් විසින් සැකකරුවෝ අත්අඩංගුවට ගන්නා ලදහ.
   (4) 119 පොලිස් හදිසි ඇමතුම් අංශයට ලැබුණු පැමිණිල්ලකට අනුව පොලිස් නිලධාරීහු විසින් සැකකරුවෝ අත්අඩංගුවට ගන්නා ලදහ.



Department of Examinations Sri Lanka

20. පහත සඳහන් ගී ඛණ්ඩයන්හි තද කළු අකුරින් මුද්‍රිත පද ව්‍යාකරණානුකූල ව හැඳින්වෙන නම් පිළිවෙළින් දැක්වෙන පද පේළිය කුමක් ද?

- කරුමේ කිම වඳවෙන හිරු සඳිසි මිනිස්සු ........
- සුදු මුතු කුඩ යට පිනි පාවඩ පිට කඩියෙක් යනවා රජෙක් වගේ ..........
- සනරාමර ගුරු ලෝක සිවංකර කරුණා ශීතල මෙත් ධාරා ..........
- පියාණෙනි මා නැවත උපන්නොත් අපාර වූ මේ සංසාරේ ............

(1) නිපාත, කෘදන්ත, උපසර්ග, තද්ධිත (2) තද්ධිත, කෘදන්ත, නිපාත, උපසර්ග
(3) නිපාත, තද්ධිත, උපසර්ග, කෘදන්ත (4) කෘදන්ත, නිපාත, තද්ධිත, උපසර්ග

21. පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය කුමක් ද?
(1) ඓ, ඖ අක්ෂර නිත්‍ය හ්‍රස්ව ස්වර ය.
(2) දන්තජ, තාලුජ, මූර්ධජ සකාර අනුපිළිවෙළින් දැක්වෙන්නේ ස, ශ, ෂ යනුවෙනි.
(3) ය, ර, ල, ව යනු වර්ගාන්තරාක්ෂරයි.
(4) ශ කාරයට පර ව මූර්ධජ ණ කාරය යෙදේ.

- අංක **22** සිට **24** තෙක් ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

22. අමාවතුර හා බුත්සරණ ............... ගද්‍ය සාහිත්‍ය කෘතීන්ට නිදසුන් ය.
(1) ප්‍රහර්ෂණ (2) විසර්ජන (3) ප්‍රදර්ශන (4) චිරන්තන

23. ජල වාෂ්පවලින් ............... වාතය ඉහළ නැගීමෙන් ජල බින්දු බවට පත්ව් වර්ෂාව ඇති වේ.
(1) සන්නද්ධ (2) සංක්ෂිප්ත (3) සංතර්පිත (4) සංතෘප්ත

24. වැලිවිටියේ ශ්‍රී සෝරත මාහිමියන්ගේ කව්සිළුමිණ කල්පලතා ව්‍යාඛ්‍යානය සංස්කෘත, පාලි හා සිංහල සාහිත්‍ය ග්‍රන්ථ අනූදෙකකින් උපුටාගත් කරුණුවලින් .................. ය.
(1) උපලක්ෂිත ය. (2) උත්කෘෂ්ට ය. (3) පරිභාෂිත ය. (4) ප්‍රතිනිර්මිත ය.

- අංක **25** සහ **26** ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය තෝරන්න.

25. (1) පොලිස් මාධ්‍ය ප්‍රකාශකයා ප්‍රවීණ මාධ්‍යවේදියකු පමණක් නො ව නීතිඥයෙක් ද වේ.
(2) කොඩි රැගත් සියල්ලෝ ම පෙරහැරේ ඉදිරියෙන් ම ගමන් කළ යුතු ය.
(3) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් ග්‍රන්ථයට හැඳින්වීමක් සපයා ඇත.
(4) ප්‍රධාන අමුත්තා සෙසු ආරාධිතයන් සමග පෙරහැරින් උත්සව ශාලාවට සැපත් වෙති.

26. (1) සේවක ඉල්ලීම්වලට පාලකයෝ අනුමැතිය දුනහොත් ඔවුහු යළි සේවයට වාර්තා කරති.
(2) විවාහයට මාමා හෝ ඔබ හෝ මම සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් තබමි.
(3) ගොවීන්ගෙන් ඇතැමෙකු කෙම් ක්‍රම භාවිතයෙන් පළිබෝධ හානි වළකා ගනිති.
(4) රැස් කර ගත් සියලු පින් අප නමින් මිය පරලොව ගිය සියලු ඥාතීන් අනුමෝදන් වෙත්වා.

- අංක **27** සහ **28** ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථය නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

27. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් සිය **වාග්පටුත්වය** සැලළිහිණි සන්දේශය මගින් මැනවින් ස්ඵුටකර ඇත.
(1) පටු අදහස් දැක්වීම (2) පටු අර්ථ ඇති වචන භාවිතය
(3) පුළුල් වචන භාවිතය (4) ගැඹුරු අර්ථ සහිත වචන භාවිතය

28. පාඨකයන් හා විචාරකයන් වශයෙන් අප කළ යුත්තේ කවියාගේ බස් වරහට ඇඩි නීති රීති පැනවීම නොව එම සීමා **සමතික්‍රමණයට** උත්සාහ කිරීමයි.
(1) ඉක්මවා යාමට (2) ආවරණය කිරීමට (3) සම්මත කිරීමට (4) වැළැක්වීමට

[ 5 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

● අංක **29** සහ **30** යටතේ දී ඇති ප්‍රස්තාව පිරුළුවලට වඩාත් ගැළපෙන අදහස තෝරන්න.

29. හොරාගේ අම්මාගෙන් පේන ඇසීම
   (1) හොරාගෙන් පැමිණෙන විපත අම්මාගෙන් දැනගැනීම
   (2) හොරකමට අනුබලයක් වන්නේ අම්මාගේ පේන කීමයි
   (3) අම්මාගෙන් පේන ඇසුවොත් හොරකම පහසුවීම
   (4) විපත් පමුණුවන අයගෙන් ම ඒ පිළිබඳ විමසීම

30. ලිහන්නට තිබෙන මල්ල ඔබන්නේ කුමට ද?
   (1) ඔබා බලන්නේ ද ලිහන්නට තිබෙන මල්ල ය
   (2) ඔබා බැලීමෙන් මල්ලේ තිබෙන දේ හැළීමෙන් වැළකීම
   (3) නිසැක ව ම දැන ගත හැකි දේට කරන අනවශ්‍ය විපරම
   (4) ඔබා බැලීමෙන් මල්ල ලිහන්නට අවශ්‍ය නොවේ

31. කොච්චර වලිකෑවත් උන්දලාට ඉතිරි වුණේ මෙච්චර තමයි.
   ඉහත ප්‍රකාශය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වන්නේ මින් කුමක් ද?
   (1) මෙතරම්වත් ඉතිරි වුණේ ඔවුන් එතරම් උත්සාහ කළ නිසා ය.
   (2) කොතරම් උත්සාහ කළත් ඔවුන්ට අවසානයේදී ඉතිරි වූයේ මෙපමණකි.
   (3) කොතරම් උත්සාහ කළත් මෙතරම්වත් ඉතිරි වීම වාසනාවකි.
   (4) උත්සාහයේ හැටියට ප්‍රතිඵල ලැබේ.

32. එකිනෙකට අනුරූප ලෙස වචන යුගල යෙදී නැති පද පේළිය තෝරන්න.
   (1) සමරු ඵලකය, නිරවද්‍ය චින්තනය, කිත් පැසසුම්, රුක්ෂ පිළිවෙත්
   (2) පරිත්‍රාණ දේශනය, මස් බිදීම, දරු සෙනෙහස, නීල ආකාශය
   (3) පින් කෙත, පාත්‍ර චීවර, ශූර වීර, කථා ව්‍යවහාරය
   (4) ලෝක ශාසනය, දිවා භෝජනය, කාව්‍ය අලංකාර, සංඝ භේදය

33. මුලින් දී ඇති පදයට සමාන අර්ථයක් සහිත පදයක් ඇතුළත් නොවන පද පේළිය කුමක් ද?
   (1) ආලෝකය - එළිය, ප්‍රභාව, අලු, කාන්තිය  (2) අවුරුද්ද - වසර, වස්, වා, වර්ෂය
   (3) මුහුණ - වත, වුවන, මුහුල, වක්ත්‍රය  (4) රජ - නරනිඳු, මීපල්, නරදෙව්, භූපති

34. මුලින් දැක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොදෙන පදයක් ඇතුළත් පද පේළිය තෝරන්න.
   (1) කලාතුරකින් - සතත, නිබඳ, නිරතුරු, නිති
   (2) උද්යෝගී - උදාසීන, නිරුත්සාහ, අකාර්යක්ෂම, ප්‍රමාදී
   (3) විවෘත - සංවෘත, වැසුණු, පිහිකුළු, ආවරණය වූ
   (4) පරිපූර්ණ - අසම්පූර්ණ, නොපිරුණු, ඌන, පිරිපුන්

35. එක් පදයක අර්ථය සහිත හා අනෙක් පදයේ අර්ථය රහිත යුගල පද **පමණක්** ඇති වරණය කුමක් ද?
   (1) තොවිල් පවිල්, අතුරු අනතුරු, ශිල්ප ශාස්ත්‍ර, ගුණ දොස්
   (2) බාර හාර, ඉඩම් කඩම්, සල්ලි බාගෙ, සද්ද බද්ද
   (3) තොර තෝංචි, නීති රීති, වතු පිටි, හරක බාන
   (4) කුලී මලී, තරහ මරහ, මිල මුදල්, පින් පවු

36.
මෙ අප සුගතිඳු සඳ
පොබයා දනන් මන කොඳ
සඟ ගණ ගහන් මැද
වෙහෙරඹර තුරෙහි බබළන සඳ

ඉහත කවියෙන් දැක්වෙන්නේ,
   (1) රූපකාලංකාරයයි.  (2) උපමාලංකාරයයි.
   (3) ස්වභාවෝක්ති අලංකාරයයි.  (4) අතිශයොක්ති අලංකාරයයි.

[ 6 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

37. විරිත, රිද්මය, අනුප්‍රාසය හා එළිසමය යන කාව්‍යෝපක්‍රම කවියා භාවිත කරන්නේ,

(1) ශබ්ද රසය ඉක්මවා අර්ථ රසය උද්දීපනය කිරීමට ය.
(2) අර්ථ රසයෙන් තොරව ශබ්ද රසය පමණක් ජනනය කිරීමට ය.
(3) ශබ්ද රසයෙන් අර්ථ රසය තීව්‍ර කිරීමට ය.
(4) අර්ථ රසයෙන් ශබ්ද රසය ජනනය කිරීමට ය.

38.
දිලිසෙන නුබ ඉඳු සැව් සිය විලසින්
විහිදෙන මිණි අබරණ රැස් පහසින්
පුබුදින මුව තඹරැති පුර විලසින්
ඉසුරන අසෙනිය මල් දැක සතොසින්

කලා සපිරි මුවසඳ හස කැල්මෙන්
දුලා දිමුතු මුතුහර ගඟුලැල් මෙන්
බලා සිටින ලිය තම වෙත ඇල්මෙන්
බලා පුළුල් දිග නුවනග බැල්මෙන්

ඉහත පද්‍යයන්හි තද කළු අකුරින් මුද්‍රිත කාව්‍යෝපක්‍රම හැඳින්වෙන නම් අනුපිළිවෙළින් දක්වා ඇති වරණය කුමක් ද?

(1) උපමා, රූපක, රූපක, උපමා
(2) රූපක, උපමා, උපමා, රූපක
(3) උපමා, උපමා, රූපක, රූපක,
(4) රූපක, රූපක, උපමා, උපමා

39.
- පන්සිය පනස් ජාතක පොත, සිංහල ථූපවංශය, සිංහල බෝධි වංශය, අනාගත වංශය
- සද්ධර්මාලංකාරය, එළු අත්තනගලු වංශය, ශාසනාවතාරය, තිසර සන්දේශය
- සද්ධර්මරත්නාකරය, ලෝවැඩ සඟරාව, බුදුගුණ අලංකාරය, සැළලිහිණි සන්දේශය
- සද්ධර්මරත්නාවලිය, පූජාවලිය, සිදත් සඟරාව, එළු සඳැස් ලකුණ

ඉහත සඳහන් විශේෂ ග්‍රන්ථ රචනා වූ යුග පිළිවෙළ විය යුත්තේ,

(1) ගම්පළ යුගය, දඹදෙණි යුගය, කුරුණෑගල යුගය, කෝට්ටේ යුගය
(2) කුරුණෑගල යුගය, දඹදෙණි යුගය, ගම්පළ යුගය, කෝට්ටේ යුගය
(3) කුරුණෑගල යුගය, ගම්පළ යුගය, කෝට්ටේ යුගය, දඹදෙණි යුගය
(4) ගම්පළ යුගය, කුරුණෑගල යුගය, දඹදෙණි යුගය, කෝට්ටේ යුගය

40. උසස් ශිෂ්ටාචාරයක් හා සභ්‍යත්වයක් සහිත රටක සාහිත්‍යය උත්තරීතර තත්ත්වයක පවතී. අනුරාධපුර, පොලොන්නරු, දඹදෙණි, කුරුණෑගල, කෝට්ටේ වැනි සාහිත්‍ය යුග ඊට සාක්ෂි දරයි. මෙලෙස සාහිත්‍යය පෝෂණය වීම කෙරෙහි ප්‍රතිභා සම්පන්න නිර්මාණකරුවන් සිටීමත් එබඳු නිර්මාණ රස විඳීමට හැකි සංවේදී මනසකින් හා වාසනා ගුණයෙන් යුතු රසික පිරිසක් සිටීමත් යන කරුණු හේතු වී ඇත.

ඉහත සඳහන් පාඨයේ අර්ථයට **වඩාත් සමීප** අදහස දෙන වාක්‍යය තෝරන්න.

(1) උසස් සංස්කෘතියක් සහිත රටක නිර්මාණකරුවන් හා රසිකයන් සාහිත්‍යය පෝෂණය කරන බව ඓතිහාසික යුග සාක්ෂි දරයි.
(2) උසස් සංස්කෘතියක් සහිත රටක පවතින උසස් සාහිත්‍යය නිසා නිර්මාණකරුවන් හා රසිකයන් බිහිවන බව ඓතිහාසික යුග සාක්ෂි දරයි.
(3) උසස් සංස්කෘතියක පැවති ඓතිහාසික යුගවල දී උසස් සාහිත්‍යයක් බිහිවූ බවට නිර්මාණකරුවෝ හා රසිකයෝ සාක්ෂි දරති.
(4) උසස් සංස්කෘතියක් ද නිර්මාණකරුවන් හා රසිකයන් ද සහිත රටක සාහිත්‍යය පෝෂණය වන බව ඓතිහාසික යුග සාක්ෂි දරයි.

* *

[ 7 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**01 | S | I | II**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

**2567 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)**

**(01) සිංහල - II පත්‍රය**

※ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම කොටසට නියමිත ලකුණු ගණන **80** කි.

**1.** අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් අක්ෂර ලියා දක්වන්න.

(අ) ණ් අක්ෂරයෙන් අඩක් හා ඩ අක්ෂරය එකතු වීමෙන් සෑදෙන සඤ්ඤක අක්ෂරය -

(ආ) ම් අක්ෂරයෙන් අඩක් හා බ අක්ෂරය එකතු වීමෙන් සෑදෙන සඤ්ඤක අක්ෂරය -

(ii) පහත (අ) සහ (ආ) යටතේ දැක්වෙන අදහස්වලට ගැළපෙන තනි පදය බැගින් ලියන්න.

(අ) බොහෝ සෙයින් වර්ණනා කරන ලද -

(ආ) පහසුවෙන් නැමෙන සුලු -

(iii) පහත සඳහන් පද්‍ය පාඨයෙහි එන 'අදර' යන්නෙහි අර්ථ දෙක වෙන වෙන ම ලියන්න.

(අ) ලද සොඳ අදර වැනි තගෙ තෙලෙ තුඩ දුටුව

(ආ) ලොබ බැඳ අදර නොකරති කවුරු සතුටුව

(iv) (අ) 'දෛනික' යන්නෙහි ප්‍රකෘතිය හා තද්ධිත ප්‍රත්‍යය වෙන් කර ලියන්න.

(ආ) විද්‍යාලය + ඊය ගැළපීමෙන් සෑදෙන තද්ධිත පදය කුමක් ද?

(v) පහත දී ඇති පදවලට විරුද්ධාර්ථ පදය බැගින් ලියන්න.

(අ) ප්‍රත්‍යක්ෂ - (ආ) අභිජාත -

(vi) පහත දැක්වෙන පදවල **අනුක්ත** රූප ලියන්න.

(අ) සූර්ය දිව්‍ය රාජයාණෝ - (ආ) උපාසකයෝ සිවුදෙනෙක් -

(vii) පහත සඳහන් වාක්‍යයේ වචන දෙකක අක්ෂර වින්‍යාසය සදොස් ය. එම වචන **දෙක පමණක්** නිදොස් කර ලියන්න.
රජයේ පාසල්වල පළවෙනි ශ්‍රේණියට සිසුන් ඇතුළත් කිරීම පිළිබඳ අභියාචනා බාර ගැනීම සම්බන්ධ නිවේදනය කළාප අධ්‍යාපන කාර්යාලය මගින් නිකුත් කර ඇත.

(අ) ........................... (ආ) ...........................

(viii) පහත සඳහන් කර්තෘකාරක වාක්‍යය කර්මකාරකයටත්, කර්මකාරක වාක්‍යය කර්තෘකාරකයටත් හරවා ලියන්න.

(අ) කෘෂි උපදේශකවරු පාංශු සංරක්ෂණය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වති.

(ආ) විහාරාධිපති හිමියන් විසින් ශ්‍රමදානය සඳහා අපි කැඳවන ලද්දෙමු.

(ix) පහත දැක්වෙන යෙදුම්වල පෙර වචනය හා පසු වචනය අතර **නොගැළපීමක්** ඇත. වඩාත් ගැළපෙන සේ පෙර වචනය හෝ පසු වචනය සකස් කර ලියන්න.

(අ) ශුභ මොහොත (ආ) උද්‍යාන බිම

(x) පහත සඳහන් පද්‍යයේ තද කළු අකුරින් මුද්‍රිත පද කවර ක්‍රියා වර්ගයට අයත් දැයි දක්වන්න.

අතු අතිනැද ගසා ය තුරු රැසා ය
කෙළින පන්දු ලෙසා ය සහ තොසා ය
**පැන පැන** වන තිසා ය මග අසා ය
යන වඳුරන් තිසා ය නොව ලසා ය

**2.** පහත දැක්වෙන (i), (ii), (iii) හා (iv) යන විස්තර අතුරෙන් **එකක්** තෝරා ගෙන, වචන **250** කට නොඅඩු වන සේ රචනයක් ලියන්න. වරහන් තුළ ඇති අංකය ඔබේ උත්තර පත්‍රයේ ලියා, රචනය ලිවීම ආරම්භ කරන්න. රචනය සඳහා යෝග්‍ය මාතෘකාවක් ද යොදන්න. *(ලකුණු 25 යි)*

(i) ශ්‍රී පාද ලාංඡනය නිසා බැතිමතුන්ගේ ගෞරවයට පාත්‍ර වූ සමනල අඩවිය දිවයිනේ ප්‍රධාන ගංගාවලට මූලාධාර වූ සංරක්ෂිත කලාපයකි. ඓතිහාසික මෙන් ම පරිසරාත්මක ව ද වැදගත් මෙම අඩවිය රැකගැනීම පරිසර හිතකාමී රටවැසි කාගෙත් වගකීමකි.

(ii) දෙවන ලෝක සංග්‍රාමය අවසන් වීමත් සමග තුන්වෙනි ලෝක යුද්ධයක් ඇති වීමේ අවදානම වැළැක්වීම පිණිස ලෝක බලවතුන් එක්ව පිහිටුවා ගනු ලැබූ එක්සත් ජාතීන්ගේ සංවිධානය අද වන විට එම අරමුණින් බැහැරව ඇති බව රුසියා - යුක්රේන හා මැද පෙරදිග යුද ගැටුම් නිරීක්ෂණය කරන විට පෙනේ. එබැවින් සාමකාමී ලොවක් උදෙසා නව ජාත්‍යන්තර සංවිධානයක් බිහි කර ගැනීමේ අවශ්‍යතාව මතු වී තිබේ.

(iii) රටේ නීතියට හා සාමයට අභියෝගයක් වන සේ මත්ද්‍රව්‍ය උවදුර ඉහළ ගොස් තිබේ. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඊට සමගාමීව පාතාල මැර ක්‍රියාකාරකම් ද වැඩි වී තිබේ. මේ තත්ත්වය මැඩ පැවැත්වීම සඳහා ආරක්ෂක අංශ මැදිහත් ව විශේෂ මෙහෙයුම් ක්‍රියාත්මක ව පවතී. මේ පිළිබඳව සාමයට කැමති ජනතාවගේ ආශීර්වාදය ඔවුන්ට නිබඳ ව ම හිමි වේ.

[ 8 වැනි පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(iv) ඔක්තෝබර් මාසය සෑම වසරක ම කියවීමේ මාසය වශයෙන් පොත්පත් ප්‍රදර්ශන, සම්මන්ත්‍රණ, දේශන ආදිය පවත්වමින් සැමරෙතත් අද වන විට කියවීමේ පුරුද්ද සමාජයෙන් බැහැර වෙමින් පවතී. පරිගණකය, රූපවාහිනිය, අන්තර්ජාලය, සමාජ මාධ්‍ය ආදිය මගින් පහසු හා සැහැල්ලු වින්දනයක් කරා යොමු වීම නිසා කියවීම මගින් ලබන බුද්ධි වර්ධනයට හා රසඥතා වර්ධනයට අවකාශ නොලැබීමෙන් ආධ්‍යාත්මික ගුණ වගාවෙන් තොර අනාගත පරපුරක් බිහිවෙතැයි විද්වත්හු මත පළ කරති.

**3.** පහත දැක්වෙන උද්ධෘතය වචන **60 - 65** අතර වන සේ සාරාංශ කර ලියන්න. ඔබ යෙදූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න. *(ලකුණු 10 යි)*

උසස් අධ්‍යාපන මට්ටමේ සියලු විෂයයන් සාර්ථක ව ඉගෙනීමට නම් හුදෙක් මවුබස පිළිබඳ දැනුම ප්‍රමාණවත් නොවන බව අකමැත්තෙන් වුව ද පිළිගත යුතු යථාර්ථයක් වී ඇත්තේ ය. සිංහල සිසුන්ට පහසුවෙන් හා ඇතැම්විට අපහසුවෙන් ඉගෙනීමට ඇති ජාත්‍යන්තර භාෂාව ඉංග්‍රීසියි. ඉංග්‍රීසි පොතපත පරිහරණයෙන් තොර ව සමහර විෂයයන් කිසිසේත් ම උගත නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇත. නවීන දැනුම සිංහලෙන් ඉදිරිපත් කිරීම ඉතා ම පසුගාමී තත්ත්වයක පවත්නා බැවින් උසස් අධ්‍යාපනය ලබන සිසුන්ට තම ඉගෙනුම සාර්ථක කර ගැනීමට නම් ඉංග්‍රීසි දැනුම අනිවාර්යයෙන් ම ලබා ගැනීමට සිදු වී ඇත. මෙයට අමතර ව දියුණු වන තාක්ෂණය ඉදිරියේ ගෝලීයකරණයට මුහුණ දෙන අනාගත ජන සමාජයට ජාත්‍යන්තර බසක දැනුම තම එදිනෙදා කටයුතු සඳහා පවා අවශ්‍ය වනු ඇත. මේ දැනීම ලද හැකි නොයෙක් ක්‍රම ඇත ද ස්වාධ්‍යයනය එහිලා මුල් වන බව නිසැක ය.

හැකිතාක් ඵලදායක ලෙසත් සම්පූර්ණ ලෙසත් දෙවන භාෂාවක් ඉගැන්වීම සඳහා භාෂා ගුරුවරු නිතරම පාහේ නොයෙකුත් නව ක්‍රම යොදා ගනිති. ඔවුන්ගේ ක්‍රම, භාවිත කරනු ලබන බොහෝ පෙළපොත්වල ද පිළිබිඹු වී පවතිනු දැකිය හැකි ය. එහෙත් ඉගැන්වීමේ ක්‍රම සහ පෙළපොත් යනු ඉගෙනුම් ක්‍රියාවලියේ සීමිත කොටසක් පමණි. ඇත්ත වශයෙන් ම ඉගෙනුමෙන් තුනෙන් එකක් පමණකි. පන්තියේ උගන්වනු ලබන ඕනෑම විෂයයකට අදාළව පන්තියේ ඉගෙනුම් කාලයෙන් එක් පැයකට අනුපාතිකව පැය දෙකක් පන්තියෙන් බැහැරදී ඉගෙනුමෙහි නිරත විය යුතු ය යන සාම්ප්‍රදායික නීතිය පිළිගනිතොත් යමෙකුට ඇති ඉගෙනුම් කාලයෙන් තුනෙන් දෙකක් ම එකී ස්වයං ඉගෙනුම සඳහා යෙදිය යුතු බව සැලකිය යුතු ය.

**4.** පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **කෙටි පිළිතුරු** සපයන්න.
(දීර්ඝ විස්තර සැපයීම ලකුණු අඩුවීමට හේතු වේ.) *(ලකුණු 10 යි)*

අපට ලැබී තිබෙන ආදි ම සිංහල පද්‍ය කාව්‍යය සංස්කෘත රීතියට වහල්ව කරන ලද්දක් නමුදු ගද්‍ය එසේ නොවී ය. ආදි ම සිංහල ගද්‍ය කාව්‍යය ලෙස සැලකිය යුතු අමාවතුරෙහි දක්නට ලැබෙන්නේ දේශීය මාර්ගයට හුරුවන රීතියකි. ගුරුළුගෝමීහුගේ අමාවතුරු භාෂාව ද ශ්‍රේෂ්ඨ ග්‍රන්ථකාරයකු අතින් සකස් වුණු ශිලා ලිපි භාෂාව ම ය. සංස්කෘත සාහිත්‍යයෙහි ද හසළ දැනුම ඇති ගුරුළුගෝමීහු සංස්කෘත ගද්‍ය රීතියට වඩා පාලි රීතිය ගුරු කොට සැලකුවෙකි. බෞද්ධ සංස්කෘතියට ද බෞද්ධ රටක පරිසරයට ද ගැළපෙන්නේ වාක්ප්‍රපඤ්චයෙන් හා අලංකරණයෙන් දූෂණය වුණු සංස්කෘත රීතිය නොව පාලි රීතිය ය. එහෙයින් පාලි රීතිය ගුරු කොට ගත් ගුරුළුගෝමීන් අතින් හැඩ ගැසුණු දේශීය මාර්ගයක් ලෙස සැලකිය යුතු අමාවතුර රීතිය නවීන කවර බසක වුව ද උසස් සරල රීතියට දෙවන නොවන්නකි. විද්‍යාචක්‍රවර්ති නිස්සාර සංස්කෘත රීතිය ගුරු කොට නොගෙන අමාවතුරු රීතිය ම තම කවිත්වය නමැති කෝවයෙහි දමා මකා සකස් කොට ගත්තේ නම් සිංහලය කවි බසක් වශයෙන් පාලි, සංස්කෘත යන දෙකට ම වඩා මධුර ලලිත ගුණයෙන් අනූන වියත් බසක් වන්නේ ය. පාලි රීතිය හැර සංස්කෘත රීතිය ගැනීම නියම මැණික් ඉවත දමා වීදුරු මිණි අගය කොට සැලකීමක් වැන්න.

(i) ගුරුළුගෝමීන්ගේ අමාවතුරු භාෂාව සමාන වන්නේ එකල පැවති කවර ලිඛිත භාෂාවකට ද?

(ii) ගුරුළුගෝමීන් හා විද්‍යාචක්‍රවර්තීන් අනුගමනය කළ රීති දෙක මොනවා ද?

(iii) මෙහි දැක්වෙන පරිදි ගුරුළුගෝමීන් හසළ බව දැක්වූහයි සැලකිය හැකි භාෂා මොනවා ද?

(iv) බෞද්ධ පරිසරයට හා සංස්කෘතියට සංස්කෘත රීතිය නොගැළපෙන්නේ කුමක් නිසා ද?

(v) නියම මැණික් ඉවත දමා වීදුරු මිණි අගය කොට සැලකීමක් ලෙස මෙහි දක්වා ඇත්තේ කවර කාරණයක් ද?

**5.** රත්මල්ගම තිකිණියාන ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යැයි සිතා, පහත සඳහන් තොරතුරු ඇතුළත් කර අදාළ මාර්ගය ප්‍රතිසංස්කරණය කරදෙන ලෙස ඉල්ලා වයඹ පළාත් මහ ඇමතිතුමා වෙත ලිපියක් ලියන්න.

* රත්මල්ගම තිකිණියාන මාර්ගය වසර ගණනාවක සිට අබලන් ව පවතින බව
* එම මාර්ගයේ ධාවනය වූ එකම බස් රථය පවා ධාවනයෙන් ඉවත් කර ඇති බව
* පාසල් සිසු දරුවන්, රැකියාවල නියතුවූවන් ඇතුළු ගම්වැසි පවුල් රාශියක් එයින් පීඩා විඳින බව

(වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.) *(ලකුණු 15 යි)*

**නැතහොත්**

රුවන්දෙණිය ගොවිජන සේවා මධ්‍යස්ථානය මගින් මෙහෙයවනු ලබන ගෙවතු වගා ප්‍රවර්ධන වැඩ සටහන යටතේ මැදගම ග්‍රාම සේවා වසමේ පදිංචිකරුවන් වෙත බෙදා හැරීම පිණිස පහත සඳහන් තොරතුරු ඇතුළත් කරමින් එම වසමේ සංවර්ධන නිලධාරි විසින් සකස් කරනු ලබන අත්පත්‍රිකාව පිළියෙල කරන්න.

මෙම වැඩසටහන පැවැත්වෙන්නේ 2024 ජුනි මස 18 වෙනි දින පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා රුවන්දෙණිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ දී වන අතර කෘෂි ගැටලු සඳහා විසඳුම්, එළවළු බීජ හා පැළ වර්ග, පැකට් දෙක බැගින් වූ පොහොර හා වෙනත් කෘෂි උපදේශන සේවා නොමිලේ සැපයේ.

(වචන **100** ක් පමණ තිබීම ප්‍රමාණවත් ය.) *(ලකුණු 15 යි)*

***

Department of Examinations Sri Lanka

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

01 S III

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கை பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# 2567 - පිරිවෙන් සාමාන්‍ය පෙළ විභාගය - 2023 (2024)

## (01) සිංහල - III පත්‍රය

පැය දෙකයි

✳ **1, 2, 3, 4** යන ප්‍රශ්න සහ **5, 6, 7** ප්‍රශ්නවලින් එකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

**1.** අංක (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. කිසියම් අනුකොටසකට ඔබ පිළිතුරු නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න. *(ලකුණු 02 × 10 = 20 යි)*

(i) පහත සඳහන් කෘති රචනා වී ඇති සාහිත්‍ය යුග ලියන්න.

(අ) සියබස්ලකර

(ආ) අමාවතුර

(ii)

අහසේ තරු වැල් පිරිලා
පොළොවේ සුදු මල් පිපිලා
මගුල් ගෙවල් දෙකක් වගෙයි
මේ දෙපළම හැඩ ගැහිලා

(අ) මේ පද්‍ය බණ්ඩය ඇතුළත් කවිපෙළේ රචකයා කවරෙක් ද?

(ආ) මගුල් ගෙවල් දෙකක් වගේ පෙනෙන්නේ මොනවා ද?

(iii) "උඹ එල්ලුම් ගහට අරින්නෙ නෑ. උඹට ඒක තේරුණා ද?

(අ) මේ ප්‍රකාශය කරනු ලැබූයේ කවුරුන් විසින් ද?

(ආ) මේ ප්‍රකාශය ශ්‍රවණය කළ අයගේ නම ලියන්න.

(iv) 'ඉදින් නුඹවහන්සේ ගිවිස්නා සේක් වී නම් මහණ වන්නෙමි වේදැ'

(අ) මෙම පාඨය උපුටාගත් පාඩමේ නම ලියන්න.

(ආ) මේ ප්‍රකාශය හා සබැඳි අවස්ථාව කුමක් ද?

(v) එබස් අසමින් ඕ ද හිස සෝදමින් සිටි තැනැත්තියෝ සෝදා නිමි හිසකේ නො බැඳ, වහා අවුත් 'ගියත් සුළු ගෙයි. වහා එව'යි කිවූ ය.

(අ) මෙහි 'ඕ' යනුවෙන් සඳහන් අය හැඳින්වූයේ කුමන නමකින් ද?

(ආ) 'සුළු ගෙයි' යන්නෙහි අර්ථය ලියන්න.

(vi) (අ) 'ගඩලාදෙණි සන්නය' ග්‍රන්ථයේ කතුවරයා කවරෙක් ද?

(ආ) මහාවංසයේ දැක්වෙන පරිදි ජාතක පොතේ කතුවරයා කවරෙක් ද?

(vii)

අකුරට යනවයි කියලා
ටිකිරි අයිය බැදිවලමයි
ඉන්නකො මම ගුරු ගෙදරට
ගිහින් කියන්නම්

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදයෙන් ඇඟවෙන අදහස කුමක් ද?.

(ආ) මේ පද්‍ය බණ්ඩය ඇතුළත් පැදිපෙළේ රචකයා කවරෙක් ද?

(viii) පහත සඳහන් කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

වන දෙව් ලියෝ නො කොළොද සවන අබරණ
එනමග දුකෙක් නොවී ද සබඳිනි කලණ

(අ) ..............................................................................

(ආ) ..............................................................................



Department of Examinations Sri Lanka

(ix) (අ) විමලරත්න කුමාරගම කවියා අයත් වන්නේ කොළඹ යුගයේ කුමන කාණ්ඩයට ද?
(ආ) 'වසන්ත කාලය' කවි පෙළේ රචකයා නම් කරන්න.

(x) 'තෙලේ හැර ගෙන තුලූ නො මරා අපට එවනු මැනව'
(අ) මෙහි 'තෙලේ' යනුවෙන් අදහස් කළේ කුමක් ද?
(ආ) මේ පාඨය ඇතුළත් මුල් කෘතියේ නම ලියන්න.

**2.** පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා, ඒ එකිනෙකට අදාළ ව (i) සිට (v) තෙක් දී ඇති සියලුම අනුකොටස්වලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 04 × 5 = 20 යි)*

(i) "රජ්ජුරුවෝ ශෝක ඉවසාගත නො හී බුදුන්ට දක්වන්නෝ 'මුඹ වහන්සේ මහණු වන්නට **නික්මුණු** දවස් ඇති ශෝකය නන්ද කුමර - රහල් කුමර දෙදෙනාගේ මුහුණ දක්නා හෙයින් නිවිණ. නන්ද කුමරුන් මහණ වූ ශෝකය තනි රහල් කුමරුන් මුහුණ දක්නා හෙයින් **සන්හුණ**. උන් මහණ වූ ශෝකය අතික් සන්සිඳුවන්නෝ කවුරු ද? දරු පෙම් මුණුබුරු පෙම් ඇත්තේ මට මතු නො වන්නේ වේ ද? කාටත් සරි ය."
(අ) තදකළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) සුදොවුන් මහරජ බුදුරජාණන් වහන්සේ සමීපයට පැමිණ කළ ප්‍රකාශය කෙටියෙන් ලියන්න.

(ii) ඉක්බිති සර්වඥයන් වහන්සේ පෙරයම් දසපැය තෙක්ම භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යැයි යව සිව්වණක් පර්ෂදට **අභිප්‍රායානුකූල** වූ ධර්ම දේශනා කොට මැදියම් දස පැය දී දිව්‍ය බ්‍රහ්මාදී දෙවියන්ගේ ප්‍රශ්න **විසර්ජනය** කිරීමෙන් බණ වදාරා අලුයම් දසපැය පළමුවන කොට්ඨාසය සිංහසෙය්‍යාවෙන් සැතපී වැඩ හිඳ දෙවන කොටස ඵල සමාපත්තියෙන් වැඩ තුන්වන කොට්ඨාසයෙහි මහා කරුණා සමාපත්තියට සමවැද සමාපත්තියෙන් නැගී මාගෙන් බණ අසා මාර්ග ඵලයට පැමිණෙන්ට නිස්සෝ කවුරු දෝ හෝ යි වෛනෙයජනබන්ධූන් බලා වදාළ සේක්.
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) පාඨයට අනුව පෙරයම සිට අලුයම දක්වා බුදුරජාණන් වහන්සේ ගත කර ඇති ආකාරය කෙටියෙන් ලියන්න.

(iii) මරනය නොසැලී හිමාලයක් මෙන්
ඔබ ලඟ සිටි,
තුරුලට වී ඔබ වැලඳ ගනී.
අඩියෙන් අඩියට ඇසිපිල්ලෙන් පිල්ලට
මරනය වෙත ලංවෙන්නේ ඔබමයි.
බය වී මොරදෙන්නෙත් ඔබමයි.
මරනය ඔබ පසු පස්සේ නොඳුවයි

ජීවිතයැයි කියමින්
දවසක් ගානේ
වැලඳ ගන්නෙ ඔබ
මරනය පමණයි

(අ) මෙහි සඳහන් උපමාව සහ උපමේය වෙන්කොට ලියන්න.
(ආ) මේ පද්‍ය ඛණ්ඩයෙන් කවියා දක්වා ඇති අදහස කෙටියෙන් විස්තර කරන්න.

(iv) "ගමේ හැම මිනිහකු ම යැපුණේ හේන් ගොවිතැනිනි. අවුරුදු දහයකට වරක් වන රොද කපා දවා කුරක්කන්, අමු මෙනේරි, වට්ටක්කා ආදිය වපුරා ගන්නා බිම් පෙදෙස හේනකි. ගම්මුන් සතු වනයක් නැත. ඒ ආණ්ඩුව **සන්තක** ය. ආණ්ඩුවේ අවසරයක් නැතිව ගහක් කැපීම හෝ හේනක් එළි කිරීම හෝ තහනම් ය. අවසර ලබා ගත යුත්තේ ද ආරච්චිලගේ මාර්ගයෙනි. ඒ නිසා ගම්මුන්ගේ ජීවිතය පිළිබඳ ඔහුට තිබුණේ ලොකු ම බලයෙකි."
(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) ගැමි ජීවන රටාව පිළිබඳව මේ පාඨයෙන් දක්වා ඇති කරුණු කෙටියෙන් විස්තර කරන්න.

[3 වන පිටුව බලන්න.

Department of Examinations Sri Lanka

(v) රිවි බිම්බා යුරු රිවි කුල කමලකර
සියුමම්බා නිතොර ව රැඳි උර මැදුර
මෙනරම්බා හිමි රූ සිරිනි පැහැසර
පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථ දක්වන්න.
(ආ) මුළු පද්‍යයේ ම අදහස ලිහිල් බසින් ලියන්න.

3. (අ) යෝග්‍ය කාව්‍යාලංකාර යොදා ගැනීමත්
(ආ) අවස්ථා වර්ණනයේ විචිත්‍රත්වයත්

'මියුණු ඇල්ල' කවි පෙළේ සාර්ථකත්වයට හේතු වී ඇත.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(අ) උචිත ලෙස චරිත හැසිරවීමත්
(ආ) අවස්ථෝචිත ලෙස සිද්ධි පෙළ ගැස්වීමත්

'බැද්දේගම' නවකතාවේ කථා රසය තීව්‍ර කිරීමට බලපා ඇත.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

4. (අ) පරිසර වර්ණනයේ විචිත්‍රත්වයත්
(ආ) සිද්ධි ගැළපීමේ වියත්බවත්

නිසා සැළලිහිණි සන්දේශය පාඨක සිත් ඇද ගනියි.
එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

(අ) ස්ථානෝචිත ප්‍රඥාවත්
(ආ) තීරණගැනීමේ ඍජුබවත්

කුණ්ඩලකේසීගේ ජීවිතය සාර්ථක වීමට හේතු විය.
නිර්දිෂ්ට කොටසින් එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

*(ලකුණු 15 යි)*

- **5, 6, 7** ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු ලියන්න.

5. කථා රසය උද්දීපනය වන අයුරින් සිද්ධි ගැළපීම සම්බන්ධයෙන් සද්ධර්මාලංකාර කතුවරයා සතුව තිබූ කුසලතාව 'ධම්මසවණොපාසිකා වස්තුව' ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

6. ජීවන අරගලය ජය ගැනීමට උත්සුකවන්නකු ගැන කවියා සංවේදී වන අයුරු 'අඳුර අපේ දුක නිවාවි' කවිපෙළෙන් නිරූපිතය. උදාහරණ තුනක්වත් දක්වමින් විස්තර කරන්න. *(ලකුණු 10 යි)*

7. බෝසත් හංසයා තමා පත් වූ අපහසුතාව යටපත් කරගෙන තම වර්ගයාගේ යහපත තකා කටයුතු කරන ආකාරය 'චුල්ලහංස ජාතකය' ඇසුරෙන් උදාහරණ තුනක්වත් දක්වමින් පැහැදිලි කරන්න. *(ලකුණු 10 යි)*

* * *

Department of Examinations Sri Lanka

Department of Examinations Sri Lanka
Department of Examinations Sri Lanka